# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1993 අංක 25 දරන ලංකාවේ සංවර්ධන මූදල් සංස්ථා (සංශෝධන) පනත

---

[සභාතීකය සමහන් කළේ 1993 ජූනි මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1993 ජූලි මස 02 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 90 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1993 අංක 25 දරන ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1993 ජූනි මස 30 වන දින]

එල්. ඩී.—ඕ. 83/92

**ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

*කෙටි නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.*

1. මේ පනත 1993 අංක 25 දරන ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. මේ පනතේ 7(1) වගන්තිය හැර අනෙකුත් වගන්තිවල විධිවිධාන, මේ පනත පාර්ලිමේන්තු පනතක් බවට පත් වන දිනයේදී බලාත්මක වන්නේය. 7(1) වගන්තියේ විධිවිධාන, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක බලාත්මක වන්නේය.

*165 වන අධිකාරයේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.*

2. මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථා පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය, එහි (අ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(අ) ශ්‍රී ලංකාවේ, පෞද්ගලික, කාර්මික, කෘෂිකාර්මික සහ වාණිජ ව්‍යවසායයන්, ප්‍රවර්ධනය කිරීම, පිහිටුවීම, පුළුල් කිරීම, පවත්වාගෙන යාම හා නවීකරණය කිරීම සඳහා සහාය වීම ;".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.*

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය, මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන ඡේදයේ "දීර්ඝ කාලීන හෝ මධ්‍ය කාලීන ණය මුදල්වල ආකාරයෙන්" යන වචන වෙනුවට "ණය මුදල්වල ආකාරයෙන්" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (vii) වන ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(vii) ශ්‍රී ලංකාවෙහි පෞද්ගලික, කාර්මික, කෘෂිකාර්මික හා වාණිජ ව්‍යවසායයන්ට හෝ ඒ සඳහා කළමනාකරණ, කාර්මික, ලේකම් කටයුතු සහ පරිපාලන උපදෙස් හා වෙළෙඳ බැංකු සේවා සැපයීම සහ කළමනාකරණ, කාර්මික, ලේකම් කටයුතු, පරිපාලන සහ වෙළෙඳ බැංකු සේවා ලබා ගැනීමෙහිලා සහාය වීම." ;

(3) ඒ වගන්තියේ (xiii) වන ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(xiii) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව ගනුදෙනු කළ හැකි හෝ පැවරිය හැකි හෝ එසේ ගනුදෙනු කිරීම හෝ

පැවරීම කළ නොහැකි හෝ වුවද කාර්මික, කෘෂිකාර්මික හෝ වාණිජ ව්‍යවසායන්හි විනිමය බිල්පත්, පොරොන්දු නෝට්ටු, කූපන්පත්, අණකර, සෑණ පත්‍ර, සහතික, කොටස්කර, බැඳුම්කර සහ වෙනත් සාධන පත්‍ර සහ සුරැකුම්පත් භාර ගැනීම, වට්ටම් කිරීම, ප්‍රති වට්ටම් කිරීම, මිල දී ගැනීම, විකිණීම සහ ඒ සම්බන්ධයෙන් ගනුදෙනු කිරීම ";

(4) ඒ වගන්තියේ (xv) වන ඡේදය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

" (xv) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණවල සහ එසේ තීරණය කරනු ලැබිය හැකි කොන්දේසි මත, එසේ තීරණය කරනු ලැබිය හැකි කාලසීමාව සඳහා බැඳුම්කර හා සෑණ පත්‍ර නිකුත් කිරීම හා යම් තැනැත්තකුගෙන් කාල නියමයක් සහිත තැන්පතු භාර ගැනීම ; ".

(5) ඒ වගන්තියේ (xxii) ඡේදය, එහි (xxxiii) ලෙස නැවත අංක යෙදීමෙන් ;

(6) ඒ වගන්තියේ (xxi) ඡේදයට ඉක්බිතිවම මෙහි පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

" (xxii) යම් කාර්මික, කෘෂිකාර්මික හෝ වාණිජ ව්‍යවසාය යකින් අයවිය යුතු ගෙවීම් සඳහා හෝ ඉටුවිය යුතු බැඳීම ඉටු කිරීම සම්බන්ධයෙන් ඇපවීම ; ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (1) සංස්ථාවේ බලයලත් කොටස් ප්‍රාග්ධනය එක් කොට සක් රුපියල් දහය බැගින් වූ සාමාන්‍ය කොටස් මිලියන පන්සියයකට බෙදන ලද රුපියල් මිලියන පන්දහසක් විය යුතු ය ; ".

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ " මහජනයා වෙත " යන වචන ඉවත් කිරීමෙන් ;

(3) ඒ වගන්තිය අගට මෙහි පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීමෙන් :—

" (3) (අ) සංස්ථාවේ මුළු නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට පහළොවකට වැඩි ප්‍රමාණයක් යම් සමාගමක්, සංස්ථාගත මණ්ඩලයක් හෝ පුද්ගලයකුට අයත් වීම යම් වෙන්කර දීමක හෝ ලියාපදිංචි කිරීමක හෝ ප්‍රතිඵලය වන්නේ නම්, ඒ සමාගමෙහි, සංස්ථාගත මණ්ඩලයෙහි හෝ පුද්ගලයාගේ නාමයෙන් ;

(ආ) ඒ වෙන්කර දීමෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ඒ සමාගම සහ (i) වන, (ii) වන, (iii) වන සහ (iv) වන අනුඡේදවල සඳහන් තැනැත්තන් ගෙන් එක් තැනැත්තකු හෝ තැනැත්තන් වැඩි දෙනකු එකතුව සංස්ථාවේ මුළු නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට පහළොවකට වැඩි යෙන් අයත් කර ගැනීම ප්‍රතිඵලය වන්නේ නම්, සමාගමක සහ පහත දැක්වෙන ඒවායින් යම් එකක හෝ වැඩි ගණනක—

(i) එහි යම් පාලිත සමාගමක;

(ii) එහි පාලක සමාගමක;

(iii) එහි පාලක සමාගමේ පාලිත සමාගමක; හෝ

(iv) ඒ සමාගම හෝ එහි පාලිත සමාගම හෝ එහි පාලක සමාගම හෝ එහි පාලක සමාගමේ පාලිත සමාගමක සැලකිය යුතු සම්බන්ධතා වක් ඇති සමාගමක

නාමයෙන්;

(ඇ) ඒ වෙන්කර දීමෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ඒ පුද්ගලයා සහ (i) වන, (ii) වන, (iii) වන, (iv) වන, (v) වන, (vi) වන සහ (vii) වන අනු ඡේදවල සඳහන් තැනැත්තන්ගෙන් එක් තැනැත් තකු හෝ තැනැත්තන් වැඩිදෙනෙකු සංස්ථාවේ මුළු නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට පහ ළොවකට වැඩියෙන් අත්කර ගැනීම ප්‍රතිඵලය වන්නේ නම්, පුද්ගලයකුගේ සහ පහත දැක්වෙන ඒවායින් යම් එකක හෝ වැඩි ගණනක එනම්:—

(i) තමාගේ කිට්ටු ඥාතීන්ගේ නාමයෙන්;

(ii) තමාට සැලකිය යුතු සම්බන්ධතාවක් ඇත්තා වූ හෝ තමාගේ කිට්ටු ඥාතියාට සැලකිය යුතු සම්බන්ධතාවක් ඇත්තා වූ සමාගමක නාමයෙන්;

(iii) (ii) වන අනුඡේදයෙහි සඳහන් සමාගමක පාලිත සමාගමක නාමයෙන්;

(iv) (ii) වන අනුඡේදයෙහි සඳහන් සමාගමක පාලක සමාගමක නාමයෙන්;

(v) (ii) වන අනුඡේදයෙහි සඳහන් පාලක සමාග මක පාලිත සමාගමක නාමයෙන්;

(vi) (ii) වන අනුඡේදයෙහි සඳහන් සමාගමක හෝ එහි පාලිත සමාගමක හෝ එහි පාලක සමාගමක හෝ එහි පාලක සමාගමේ පාලිත සමාගමක සැලකිය යුතු සම්බන්ධතාවක් ඇත්තා වූ සමාගමක නාමයෙන්; හෝ

(vii) ඒ පුද්ගලයාට හෝ ඒ පුද්ගලයාගේ කිට්ටු ඥාතියාට සැලකිය යුතු සම්බන්ධතාවක් ඇත්තා වූ සමාගමක් නොවන සංස්ථාගත මණ්ඩලයක නාමයෙන්

සංස්ථාව විසින්, (1) වන උපවගන්තිය යටතේ කොටස් කිසිවක් වෙන්කර දීම හෝ කොටස් කිසිවක් ලියාපදිංචි කිරීම හෝ නොකළ යුතු ය.

මේ උපවගන්තියේ අර්ථානුකූලව සමාගමකට හෝ පුද්ගලයකුට යම් සමාගමක හෝ සමාගමක් නොවන සංස්ථාගත මණ්ඩලයක සැලකිය යුතු සම්බන්ධතාවක් ඇත්තේ යයි සලකනු ලැබිය යුත්තේ, අවස්ථාවෝචිත පරිදි, එම සමාගමේ හෝ සංස්ථාගත මණ්ඩලයේ කොටස්වලින් සියයට පනස් එකකට වැඩි කොටස් ප්‍රමාණයක් ඉහත සඳහන් සමාගමට හෝ පුද්ගලයාට අයත් අවස්ථාවක දී ය.

(4) (3) වන උපවගන්තියේ කාර්ය සඳහා—

"කිට්ටු ඥාතියා" යන්න යම් තැනැත්තකු සම්බන්ධයෙන් යෙදෙන විට ඒ තැනැත්තාගේ දෙමාපියන්ගෙන් කෙනෙකු, අඹු/සැමි හෝ දරුවකු හෝ ඒ තැනැත්තාගේ දරුවකුගේ අඹු/සැමි අදහස් වේ ;

"පාලිත සමාගම" යන්නෙහි 1988 අංක 30 දරන බැංකු පනතේ 8 වන වගන්තියෙහි ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.**

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය, මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (4), (5), (6) සහ (7) වන උපවගන්ති පිළිවෙළින් ඒ වගන්තියේ (3), (4), (5) සහ (6) ලෙස නැවත අංක යෙදීමෙන් ;

(3) ඒ වගන්තියේ නැවත අංක යෙදූ (4) වන උපවගන්තියේ—

(අ) "(6) වන උපවගන්තිය යටතේ තෝරා පත්කර ගනු ලැබීමට" යන වචන වෙනුවට "(5) වන උපවගන්තිය යටතේ තෝරා පත්කරගනු ලැබීමට" යන වචන ආදේශ කිරීමෙන්,

(ආ) ඒ උපවගන්තියේ "කිසිදු කොටස්හිමි අධ්‍යක්ෂවරයකු විසින් අවුරුදු අටකට වැඩි අඛණ්ඩ කාලසීමාවක් සඳහා ධුරය නොදැරිය යුතුය" යන වචන අත්හැරීමෙන් ;

(4) ඒ වගන්තියේ, නැවත අංක යෙදූ (5) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "මහජන මන්ත්‍රීවරයෙක් හෝ පළාත් පාලන ආයතනයක සභිකයෙක් හෝ නොවේ නම්" යන වචන වෙනුවට "පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙක් හෝ පළාත් පාලන ආයතනයක සභිකයෙක් හෝ නොවේ නම්" යන වචන ආදේශ කිරීමෙන් ;

(5). ඒ වගන්තියේ, නැවත අංක යෙදූ (6) වන උපවගන්තියේ "ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබුවහොත් මිස ඒ තෝරා පත් කර ගැනීම වලංගු නොවන්නේ ය" යන වචන අත් හැරීමෙන්.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 10අ වගන්තිය ඉවත් කිරීම.**

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 10අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.**

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය, එහි (9) වන උප වගන්තිය ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 14අ සහ 14ආ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.**

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියට ඉක්බිතිවම මෙහි පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 14අ සහ 14ආ වගන්ති ලෙස බලාත්මක වන්නේ ය.:—

**"සංවර්ධන මූල්‍ය සංස්ථා සෘණපත්‍ර හා ස්කන්ධ.**

14අ. (1) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සෘණපත්‍ර හා ස්කන්ධ ඇති කර නිකුත් කළ හැකි අතර, එසේ ඇතිකර නිකුත් කරන සෘණපත්‍ර හා ස්කන්ධ මේ පනතෙහි මින්මතු පිළිවෙළින් "ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථා සෘණපත්‍ර" යනුවෙන් හා "ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථා ස්කන්ධ" යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) "ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථා සෘණපත්‍ර" සහ "ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථා ස්කන්ධ" නිකුත් කිරීම, පැවරීම, ඒ සම්බන්ධ ගනුදෙනු කිරීම, බේරුම් කිරීම සහ අවලංගු කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි කොන්දේසි හා නියමයන්ට අනුකූලව කළ යුතු ය.

(3) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇතිකොට නිකුත් කරන "ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථා සෘණපත්‍ර" සහ "ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථා ස්කන්ධ" කිසිවක මුල් මුදල ආපසු ගෙවීම සහ පොලිය ගෙවීම සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් ඇප විය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ වූ යම් ඇප වීමකින් නිදහස් වීම සඳහා අවශ්‍ය මුදල් ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතු ය.

ගිණුම් ආදිය පාර්ලිමේන්තුව හමුවේ තැබිය යුතු බව.

14ආ. එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු හැකිතාක් ඉක්මණින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් සංස්ථාවේ ගිණුම් ප්‍රකාශය පිළිබඳ වාර්තාව ද, ඒ මුදල් වර්ෂය තුළ දී—

(අ) සංස්ථාව විසින්, ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුවෙන් හෝ ආණ්ඩුව විසින් අනුමත කරන ලද වෙනත් යම් ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයකින් ලබාගත් සෑම ණය මුදලක් පිළිබඳව ; සහ

(ආ) 14 වන හෝ 14අ වගන්තිය යටතේ ආණ්ඩුව විසින් දෙන ලද සෑම ඇපවීමක් පිළිබඳව

වූ ප්‍රකාශයක් ද පාර්ලිමේන්තුව හමුවේ තැබීමට සැලැස්විය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරුන් දෙදෙනකු විසින්" යන වචන වෙනුවට "සුදුසුකම් ලත් විගණකවරයකු විසින්" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "සංස්ථාවේ විගණකවරයන්ගේ" යන වචන වෙනුවට "සංස්ථාවේ විගණකවරයාගේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "සංස්ථාවේ එක් එක් විගණකවරයා වෙත" යන වචන වෙනුවට "සංස්ථාවේ විගණකවරයා වෙත" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "සංස්ථාවේ එක් එක් විගණකවරයා විසින්" යන වචන වෙනුවට "සංස්ථාවේ විගණකවරයා විසින්" යන වචන ආදේශ කිරීමෙන් ;

(5) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ—

(අ) "සංස්ථාවේ එක් එක් විගණකවරයා විසින්" යන වචන වෙනුවට "සංස්ථාවේ විගණකවරයා විසින්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) "සත්‍ය වූ ද නිවැරදි වූ ද දර්ශනයක්" යන වචන වෙනුවට "සත්‍ය වූ ද සාධාරණ වූ ද දර්ශනයක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(6) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ "සංස්ථාවේ එක් එක් විගණකවරයාගේ වාර්තාව" යන වචන වෙනුවට "සංස්ථාවේ විගණකවරයාගේ වාර්තාව" යන වචන ආදේශ කිරීමෙන් ;

(7) ඒ වගන්තියේ (7) වන උපවගන්තියේ "සංස්ථාවේ එක් එක් විගණකවරයාගේ වාර්තාවේ" යන වචන වෙනුවට "සංස්ථාවේ විගණකවරයාගේ වාර්තාවේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(8) ඒ වගන්තියේ අගට මෙහි පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(8) මේ වගන්තියෙහි "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්,—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, තැනැත්තෙක් හෝ

(ආ) යම් ගණකාධිකාරි සමාගමක එක් එක් න්වාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේද එමෙන්ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරි සමාගමක් හෝ

අදහස් වේ".

10. මෙහි පහත දැක්වෙන අලුත් වගන්ති, 16 වන වගන්තියට ඉක්බිතිවම ඇතුළත් කරනු ලබන අතර ඒවා පිළිවෙළින් ප්‍රධාන ප්‍රඥප්තියේ 16අ සහ 16ආ වගන්ති ලෙස බලපවත්වන්නේ ය :— *ප්‍රධාන ප්‍රඥප්තියේ 16අ සහ 16ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.*

*"සංස්ථාව සාක්ෂි ආඥාපනතේ අර්ථානුකූලව බැංකුවක් ලෙස සැලකෙන බව.*

16අ. සංස්ථාව, ඉල්ලුම් තැන්පතු භාර නොගත් තද එය නොතකා සංස්ථාව, සාක්ෂි ආඥාපනතේ VI වන පරිච්ඡේදයේ අර්ථානුකූලව බැංකුවක් ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව, ඒ පරිච්ඡේදයේ විධිවිධාන සංස්ථාව කෙරෙහි හා සංස්ථාව සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

*වැරදි.*

16ආ. (1) (අ) සංස්ථාවේ කොටස් කිසිවක්, දැන දැනම, 7(3) වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් යම් තැනැත්තකුට හෝ යම් තැනැත්තකුගේ නමින් වෙන් කර දෙන හෝ ලියාපදිංචි කරන ;

(ආ) සංස්ථාවේ කොටස් කිසිවක්, දැන දැනම, 7(3) වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් යම් තැනැත්තකුට හෝ යම් තැනැත්තකුගේ නමින් වෙන්කර දීමට හෝ ලියා පදිංචි කිරීමට සලස්වන ; සහ

(ඇ) සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු, සේවා නියුක්තයකු හෝ විගණකවරයකුව සිටිමින් සංස්ථාවේ ගනුදෙනුවක් හා සම්බන්ධ යම් කාරණයක්, ඒ කාරණය හෙළිදරව් කිරීමට මේ පනත මගින් බලය පැවරී ඇති කාර්යයක් නොවන වෙනත් යම් කාර්යයක් සඳහා හෙළි දරව් කරන

සෑම තැනැත්තකුම මේ පනත යටතේ වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) මේ පනත යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබූ අවස්ථාවක—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් වන්නේ නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු සහ නිලධරයකු; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් වන්නේ නම්, ඒ ව්‍යාපාර ආයතනයේ සෑම හවුල්කරුවකු

ඒ වරද සම්බන්ධයෙන් වරදකරු සේ සැලකිය යුතු ය:

එසේ වුව ද ඒ වරද සිදු කර ඇත්තේ තමාගේ අනුදැනුමක් නොමැතිව බව හෝ ඒ වරද කිරීම වැළැක්වීම පිණිස ගත යුතු නිසි සියලු පියවර ඉතා ඕනෑකමින් ගනිමින් ක්‍රියා කළ බව ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු විසින් හෝ නිලධරයකු විසින් හෝ ඒ ව්‍යාපාර ආයතනයේ හවුල්කරුවකු විසින් හෝ ඔප්පු කරනු ලැබුවහොත්, ඔහු ඒ වරද සම්බන්ධයෙන් වරදකරු සේ නොසැලකිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) "කාර්මික ව්‍යාපාරය" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව, මෙහි පහත දැක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන්—

'ණය' යන්නට කවර වූ හෝ ආකාරයකින් විස්තර කර ඇති මූදල් පහසුකම් ඇතුළත් වේ;

(ආ) "පළාත් පාලන ආයතනය" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිවම මෙහි පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

'පළාත් සභාව' යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය යටතේ පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ.".

**12.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 255, බෞද්ධාලෝක මාවත, කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.